ළමුන් සඳහා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වැඩසටහන - 2022 ජනවාරි

ළමුන්ට පාසලේදී ලැබෙන විධිමත් අධ්‍යාපනයට එහා ගොස් ළමා පෞරුෂය ගොඩනැගීමට ඉවහල් වෙන, ලංකා ළමා හා යොවුන් රඟහල පදනම පවත්වනු ලබන ළමුන් සඳහා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වැඩසටහනේ 2022 ජනවාරි අදියර ආරම්භ වීමට නියමිතය.

පාසැල් විෂය නිර්දේශවල සීමාවලින් ආවරණය නොවෙන, ක්‍රියාකාරකම් තුළින් ළමුන්ගේ වැඩීමට මෙම වැඩසටහන දායක වේ.

ආයතනය පිළිබඳ හැඳින්වීමක්ලංකා ළමා හා යොවුන් රඟහල පදනම සහ එහි නාට්‍ය නිෂ්පාදන හා පුහුණු අංශය වන සෝමලතා සුබසිංහ ප්ලේහවුස් (Somalatha Subasinghe Play House) ආයතනය 1981 දී සෝමලතා සුබසිංහ විසින් ස්වෙච්ඡා සංවිධානයක් ලෙස ආරම්භ කරන ලදී.

ලංකාවේ ළමා හා යොවුන් නාට්‍ය නිෂ්පාදනය, රඟදැක්වීම, වර්ධනය හා එවැනි නාට්‍ය නිෂ්පාදනය හා වැදගත්කම පිළිබඳව සමාජය තුළ උනන්දුවක් හා කතිකාවක් ඇති කිරීම, ළමා නාට්‍යකරණය විද්‍යානුකූලව හැදෑරීම සහ ඒ සඳහා ශිල්පීන් පුහුණු කිරීම යනාදිය අරමුණු විය.

වර්තමානය වනවිට මෙම ආයතනය ළමා හා යොවුන් නාට්‍ය නිෂ්පාදනය, රඟදැක්වීම, අධ්‍යයනය සහ පුහුණුව පිළිබඳ ලංකාවේ පුරෝගාමී සංවිධිත ආයතනය වෙයි. 1981 වර්ෂයේ සිට ළමුන් හා යෞවනයින් සඳහා සංගීතමය නාට්‍ය හා වැඩිහිටි ප්‍රේක්ෂාගාරය සඳහා ප්‍රධාන ප්‍රවාහයේ නාට්‍ය ද බොහෝ සංඛ්‍යාවක් නිෂ්පාදනය කර ඇත.

එම නාට්‍ය ලංකාව තුළ මෙන්ම විදේශවලදී ද රඟ දක්වා ඇත. මෙම ආයතනය 2007 ජනවාරි මාසයේදී අංක 03 දරන ආඥා පනත මගින් "ලංකා ළමා හා යොවුන් රඟහල පදනම" ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සංස්ථාගත කරන ලදී.

වැඩසටහන පිළිබඳ හැඳින්වීමක්

මෙම වැඩසටහන අවුරුදු 4 1/2 සිට 12 දක්වා ළමුන් සඳහා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ලෙස හඳුන්වනු ලැබේ. මෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ සෞන්දර්යාත්මක අත්දැකීම් මගින් ළමුන්ට තුලනාත්මක කායික හා මානසික වර්ධනයක් ලබාදීම හා ළමුන්ගේ ක්‍රීඩාශීලිත්වය, ප්‍රබෝධමත්භාවය සහ මූලික කලා ශිල්ප එනම්, සංගීතය, නැටුම්, රංගනය යනාදිය පිළිබඳව ළමුන්ගේ රසඥතාවය වර්ධන කිරීමය.

ඒ අනුව මෙම පාඨමාලාව ළමුන් පාසලේදී ලබා ගන්නා විධිමත් අධ්‍යාපනයට දායක වන අතිරේක ක්‍රියාකාරකම් අධ්‍යාපනයක් ලෙස සැළකිය හැකිය. මෙම වැඩසටහනට සහභාගිවන ළමුන්ට සංගීතය රස විඳීම සහ ඇගයීම, නිදහස් චලනය, නැටුම් හා රිද්මයානුකූල චලනය, රංගනය හා භාෂාව, චිත්‍ර, ගායනය, රූකඩ හා අත්වැඩ යනාදිය පිළිබඳව මූලිකාංග අවබෝධයට අවස්ථාවක් ලැබෙනු ඇත.

මෙම වැඩසටහන කෞශල්‍යා ප්‍රනාන්දු සහ ආචාර්ය චන්දන අලුත්ගේ විසින් මෙහෙයවනු ලබන අතර සෝමලතා සුබසිංහ් ප්ලේහවුස් ආයතනයේ අධීක්ෂණය යටතේ විශේෂ පුහුණුවලත් ශිල්පීන් කණ්ඩායමක් ද වැඩසටහන් මෙහෙයවයි.

කාලසටහන

මෙම වැඩසටහන සති 12 ක කාලයක් ( ජනවාරි 8 වන දා සිට මාර්තු 26 වන දා දක්වා ) සෙනසුරාදා දිනවල දී පෙ.ව 08 30 - පෙ.ව 11.00 දක්වා පවත්වනු ලබයි.

ස්ථානය

බත්තරමුල්ල ජයන්තිපුර ප්‍රධාන මාර්ගයෙහි පිහිටි බත්තරමුල්ල සිංහ සමාජ ශාලාවේදී වැඩසටහන් පවත්වනු ලබයි.

අය කිරීම

මෙම පාඨමාලාව සඳහා අය කිරීම රු. 5000/- කි. මීට අමතරව රු. 500/- ක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක්ද අය කරනු ලැබේ. පාඨමාලා ගාස්තුව එකවර ආරම්භක දිනයේ දී අය කරන බව කරුණාවෙන් සළකන්න. එක් පවුලකින් දෙදෙනකු සහභාගිවන විට දෙවන දරුවාට ගාස්තුවෙන් සීයට 10ක වට්ටමක් ලබා දෙනු ඇත.

වැඩසටහනට සහභාගිවන දරුවාට අවශ්‍ය ආහාරපාන සහ පහසු ඇඳුමක් රැගෙන ආ යුතුය.